**හලාවත නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
----------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 මැයි 11 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 20 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත් ශ්‍රී ලංගම බස් රථ නැවතුම්පල වෙනුවෙන් සමාලෝචිත වසර තුල සභාවට ලැබිය යුතු හිඟ ගාස්තු රු.375,000 ක් හා රු.2,343,000 ක් වටිනා අංක 818555 දරණ මහජන බැංකු ස්ථාවර තැන්පතුව වෙනුවෙන් 2013 මැයි 14 දින සිට 2013 නොවැම්බර් 14 දින දක්වා ලැබී තිබු රු. 147,641 ක පොලිය ආදායමට ගෙන නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.477,390 ක වැටුප් ප්‍රතිපූර්ණ ආදායම සහ රු.193,590 ක්වූ ඉතිරිකිරීමේ තැන්පත් සඳහා ලැබිය යුතු පොලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ආදායම් ලේඛණ අනුව බිල්කළ නිල නිවාස කුලී, වෙළඳ ස්ථාන කුලී හා බදු කුලී ආදායම් රු. 3,224,770 ක් ගිණුම්වලට ගෙන නොතිබුණි. එසේම බිල්කළ පුනරාවර්තන ආදායම් එකතුව රු. 402,688 ක් වූ ජලනල එළීමේ ගාස්තු හා පරිසර බලපත්‍ර ගාස්තු ගිණුම්වලට ගෙන නොතිබුණු අතර, හිඟ මුද්දර ගාස්තු රු. 13,822,446 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මුල් මාස තුන තුල ගබඩාවට ලැබුණු රු.145,162 ක තොගයේ වටිනාකම සදොස් ලෙස පෙර ගෙවුම් අත්තිකාරම් ගිණුමට බැර කර තිබුණි.

(ඉ) පෙර වර්ෂයේ කර්මාන්ත ණය හිමියන් සඳහා රු.380,376 ක්වූ අධි වෙන්කිරීම වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් කර නොතිබුණි.

(ඊ) මග නැගුම වැඩසටහන යටතේ නගර සභාවේ මාර්ග සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතුව තිබු රු. 2,825,494 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා තිබියදීත්, නැවත රු.මිලියන 7 ක් සඳහා ව්‍යාපෘතියේ මුළු පිරිවැය සඳහා ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබුණි. ඒ අනුව නැවත

ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් සහ ප්‍රාග්ධන වැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) වර්ෂාවසානයේ ඉතිරි තොගයේ වටිනාකම රු.6,701,664 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ මාර්තු 31 දින දක්වා පමණක් ගබඩා අත්තිකාරම් ගිණුම අනුව තොග ලැබීම් රු 1,451,628 ක් වුවද, මුදල් පොත අනුව එම කාලය තුල ගබඩා අත්තිකාරම් මඟින් මිලදී ගැනීම් රු. 97,025 ක් පමණක් වී තිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්**

**--------------------------**

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 08 ක එකතුව රු. 144,858,111 ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව අදාල ශේෂයන්ගේ එකතුව රු. 147,960,583 ක් වූයෙන් රු. 3,102,472 ක නොසැසඳුන ශේෂයක් අනාවරණය විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**------------------------------------**

(අ) 2011 වර්ෂයට පෙර සිට පළාත් පාලන කොමසාරිස්ගෙන් අයවිය යුතුව තිබු හිඟ විනෝද බදු රු. 501,257 ක් අයකර ගැනීම සැක සහිතව තිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබු ගිණුම් ශේෂවල වටිනාකම රු. 67,768,317 ක්වූ අතර ඉන් රු.10,193,902 ක් වර්ෂයක කාලයක් ඉක්මවා නිරවුල් කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

----------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.90,205,613 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාල ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**2. මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.21,186,075 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,060,148 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභා සීමාව තුල ස්ථිර දැන්වීම් පුවරු, කටවුට් හා බැනර් ප්‍රදර්ශනය කිරීමට අදාල මාර්ගෝපදේශ සහ ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණු අතර, ගාස්තු අයකිරීම සභා තීරණයක් මත සිදුකර තිබීම හේතුවෙන් අනවසර හා අනවශ්‍ය ස්ථානවල ප්‍රදර්ශනය කරනු ලබන පුවරු ඉවත් කිරීමට හෝ ඒවාට සීමාවන් පැනවීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් ගෙවිය යුතුව තිබූ රු. 1,285,852 ක් වෙනුවෙන් මුල්‍ය ප්‍රකාශනවල ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණද, එම වියදම් වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛණය මඟින් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණි.

**3.2 ව්‍යාපෘති ප්‍රමාද කිරීම**

සමාලෝචිත වසර තුලදී ගිවිසුම් අත්සන් කල වටිනාකම රු. 2,686,500 ක්වූ කර්මාන්ත 13ක් වර්ෂ අවසානය වන විටත් නිමකර නොතිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

" ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය " සම්බන්ධයෙන් 2010 වර්ෂයේ සිට ව්‍යාපෘති වාර්තා හා සැලසුම් සකස් කරමින් ඇතත්, සමාලෝචිත වර්ෂය තුලදී ද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානයට යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය
(ඊ) තොග පාලනය